**පළාත් මාර්ග ව්‍යාපෘතිය (නැගෙනහිර පළාත) - 2013**

-----------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ - (නැගෙනහිර පළාත) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස.) අතර 2010 ජනවාරි 11 දින එළඹී අංක 4630 එල්කේ දරන ණය ගිවිසුමේ 4.09(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය.

------------------------------------------------------------------------------

පළාත් මාර්ග ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ වැඩි දියුණු කරන ලද මාර්ග යටිතල පිළිබඳ තිරසාර කළමනාකරණය මඟින්, ප්‍රතිග්‍රාහකගේ නැගෙනහිර පළාතේ සමාජ - ආර්ථික මධ්‍යස්ථානවලට ප්‍රවේශය වැඩි දියුණු කිරීමයි. ව්‍යාපෘතිය ශක්‍යතා ලියවිල්ලට අනුව ව්‍යාපෘතියේ - (නැගෙනහිර පළාත) ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ ජ ඩොලර් මිලියන 20 ක් වන අතර මුළු මුදලම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම.**

**------------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහි ලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය දෙනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිල දී ගැනීම්

හඳුනා ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කර තිබුණේද යන බව.

(උ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව. සහ

(එ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණේද යන බව.

**03. මතය.**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) මූල්‍ය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන.**

**4.1 මූල්‍ය කාර්ය සාධනය.**

මූල්‍ය ප්‍රකාශනවලට හා විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.1,076,744,254 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,853,570,991 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම, ඉකුත් වර්ෂය සඳහා වූ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | 884,669,580 | 445,332,808 | 1,546,905,413 |
| ලී බඩු සවිකිරීම් | 34,740 | - | 885,440 |
| කාර්යාල උපකරණ | 267,520 | 2,290,312 | 3,054,448 |
| උපදේශක සේවා | 169,503,237 | 57,980,410 | 268,657,783 |
| වර්ධක සහ මෙහෙයුම් පිරිවැය | 22,269,177 | 11,250,537 | 34,067,907 |
| එකතුව | 1,076,744,254 | 516,854,067 | 1,853,570,991 |

4.2 **විශේෂ ඩොලර් ගිණුම**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ විශේෂ (ඩොලර් ) ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | | එ.ජ.ඩො | | රු. |
|---|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | | 1,172,530 | | 149,099,855 |
| <u>එකතු කළා</u> : ඌනපූරණයන් | | 7,515,059 | | 957,895,614 |
| විදේශ විනිමය වාසිය | | - | | 13,603,946 |
| | | 8,687,589 | | 1,120,599,415 |
| අඩු කළා :- ආපසු ගැනීම් (විආ) | 8,135,551 | | 1,048,531,310 | |
| ආපසු ගැනීම් (ප්‍රවිආ) | 98,908 | | 12,820,039 | |
| | | 8,234,459 | | 1,061,351,349 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | | <u>453,130</u> | | <u>59,248,066</u> |

**5. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**5.1 අරමුදල් උපයෝජනය**

**අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.**

| ප්‍රභවය | මූල්‍යයන ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වාර්ෂික අයවැයෙහි වෙන්කිරීම | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල | |
|---|---|---|---|---|---|---|---|
| | එජඩො | රු.මිලියන | රු.මිලියන | එජඩො | රු.මිලියන | එජඩො | රු.මිලියන |
| IDA | 20 | 2,000 | 1,090 | 8.149 | 1,059.47 | 14.5 | 1,885.00 |
| GOSL | - | - | 3 | - | 2.11 | - | 7.54 |
| **Total** | **<u>20</u>** | **<u>2,000</u>** | **<u>1,093</u>** | **<u>8.149</u>** | **<u>1,061.58*</u>** | **<u>14.5</u>** | **<u>1,892.54*</u>** |

* උපචිත වියදම් ගිණුම්ගත කිරීම හේතුවෙන් මෙම වාර්තාවේ 4.1 ජේදයේ දැක්වෙන සංඛ්‍යා සමඟ මෙම සංඛ්‍යා එකඟ නොවේ.

**5.2 භෞතික කාර්ය සාධනය**

**----------------------------**

**5.2.1 ඉදිකිරීම් වැඩ ප්‍රගතිය**

**-----------------------**

නැගෙනහිර පළාතේ කිලෝමීටර් 56.15 ක් දිග පළාත් මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා පැකේජ 05 ක් යටතේ කොන්ත්‍රාත්තු ව්‍යාපෘතිය විසින් පිරිනමා තිබූ අතර ඉන් පැකේජ 04 ක පුනරුත්ථාපන වැඩ 2013 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් නිම කර තිබුණි. කෙසේ වුවද පැකේජ 07 යටතේ පළාත් මාර්ග පුනරුත්ථාපන වැඩ සම්පූර්ණ කර නොතිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 13 ක්ව පැවතුණි. ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කළ මාර්ග පිළිබඳ ස්ථානීය පරික්ෂාව අනුව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

**(අ) පැකේජ් ඊපී - 01 යටතේ මල්වත්ත සුරිප්පොඩයි මාර්ගය ඉදිකිරීම**

-------------------------------------------------------------------------

(i) මෙම මාර්ග පැකේජය යටතේ මාර්ග උරහිස් ඉදිකිරීම් සිදුකිරීමේදී අඩුපාඩු ලැයිස්තුවකට (snag list ) අනුව කටයුතු කිරීමට උපදේශක විසින් ඉල්ලා තිබුණද, 2014 මැයි 28 දින සිදුකරන ලද භෞතික පරික්ෂාවේදී Ch 0+000 හා Ch5 +160 යන ස්ථානයන්හි මාර්ගය දෙපසම බෑවුම හා තද කිරීම ප්‍රමාණවත් නොවූ බවත් අතරින් පතර ස්ථානයන්හි බාදනයන් තිබූ බවත් නිරික්ෂණය විය. කෙසේ වුවද ඉහත සඳහන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) **Ch 0+550-0+575, Ch 0+600, Ch 0+660, Ch 0+710, Ch 0+726** සහ **Ch 0+800-0+810** යන ස්ථානයන්හි ද්විත්ව තාර මතුපිට ඇතිරීමේදී (**Double Bituminous Surface Treatment )** සෑහෙන තරමේ ස්ථානීය ගලායාම් (**Moderate localized Bleeding )** තිබුණි.

**(iii)** අධීක්ෂණ උපදේශකවරයාගේ උපදෙස් පරිදි **Ch 4+920 (**පාලම**)** ස්ථානයේ සම්බන්ධ වන කොටසේ ඇස්පල්ට් ඇතිරීම විසන්ධි කර "එපොක්සි මෝටාර්" **(Epoxy Mortar )** සහ ජොයින්ට් සීලන්ට් **(Joint Sealant )** ඇතිරිය යුතුය. කෙසේ වුවද එය එසේ සිදුකර නොතිබුණි.

(iv) ඉදිකිරීම් වැඩ දින 100 කින් ප්‍රමාද වී තිබු හෙයින් ප්‍රමාණ කළ අලාභ රු.39,789,823 ක් අයකර ගත යුතු වුවත් ගෙවීම් බිල්පත්‍රවලින් රු.18,829,229 ක මුදලක් පමණක් 2014 මැයි 28 විගණන දිනය දක්වා අයකර ගෙන තිබුණි.

(v) උපදේශකගෙන් අනුමැතිය ලබැගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් 2013 ඔක්තෝබර් 30 දින වැඩ නිම වු පසු තත්ත්වය පිළිබඳ සැලැස්ම (As built drawings) කට්ටල දෙකක් ඉදිරිපත් කළ යුතු වුවද , මාස 07 ක කාලයක් ඉකුත් වීමෙන් පසුවත් 2014 මැයි 28 විගණන දිනය දක්වාම එම සැලැස්ම කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර නොතිබුණි.

(vi) පාලම් දෙකක ඉදිකිරීමේ විෂය පථය ව්‍යාපෘතිය විසින් පසුව වෙනස්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විෂය පථය වෙනස් කිරීම හා වැඩ නිම කිරීමේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් රු.2,894,646 ක මුදලක් අතිරේක ගාස්තු ලෙස ඉල්ලා තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට අනුව, මෙම කරුණ තීරක තීන්දුවකට යොමු කර තිබුණි.

(ආ) **පැකේජ ඊපී -02 යටතේ මාර්ග ඉදිකිරීම**

---------------------------------------------

(i) **විලිනියඩ් මාර්ගය**

--------------------

**Ch 0+390, Ch 0+424, Ch 1+150, Ch 1+290 Ch 2+924** හා **Ch 3+540** ස්ථානයන්හි කොන්ක්‍රීට් පදික මඟෙහි පිපිරීම් තිබු අතර එම පිපිරීම් "වී - කට්" **(V-cut)** හා "එපොක්සි මෝටාර් " **(Epoxy Mortar)** වලින් පිරවීම මඟින් නිවැරදි කරන ලෙස උපදේශක විසින් කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලා තිබුණි. කෙසේ වුවද එය එසේ නිවැරදි කර නොතිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂට අනුව පිපිරීම් නිවැරදි කර ගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් "බාර් ඉම්යුලේෂන් **(Bar**

**Emulation**) යොදා ගෙන තිබූ අතර දැනට පරීක්ෂාව හා අධීක්ෂණය යටතේ පවතී.

(ii) **කරතිවු මාර්ගය**

**-----------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- **Ch 0+300, Ch 0+460,Ch 0+490 Ch 0+740, Ch 0+760 Ch 0+790, Ch 0+805 Ch 0+916, Ch 0+920** සහ **Ch 2+055** යන ස්ථානයන්හි හානිවීම් තිබුණි. (cover aggregate on wheel path**)**
- Ch 0+200 **හා** Ch 0+220 **යන ස්ථානයන්හි සැහෙන තරමේ ස්ථානීය ගලායාම් (**moderate localized Bleeding**) තිබුණි.**

(iii) **නින්තවුර් මාර්ගය**

**-------------------**

රු.**14,928,240** ක මුදලක් ඇස්තමේන්තු කරන ලද දිග මීටර් 700 මාර්ගයේ මැද කොටස ඉඩම් තීරු පරිත්‍යාග කළ පදිංචිකරුවන්ගේ තාප්ප නැවත ස්ථානගත කිරීමට දේපල අයිතිකරුවන් අකමැතිවීම හේතුවෙන් ඉදිකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පළල මීටර් 6 වෙනුවට මීටර් 4.5 කට මාර්ගය සැලසුම් කර තිබුණි.

(iv) උපදේශකගෙන් අනුමැතිය ලබාගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් 2013 නොවැම්බර් 21 දින වැඩ නිමවූ පසු තත්ත්වය පිළිබඳ සැලැස්ම ( As Built Drawings) කට්ටල දෙකක් ව්‍යාපෘතියට ඉදිරිපත් කළ යුතු වුවත්, කොන්ත්‍රාත්කරු විසින් එම සැලසුම් ඉදිරිපත් කර තිබුණේ 2014 අප්‍රේල් 29 දිනදීය.

(v) ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට බිල්පත් ගෙවීම් දින 227 කින් ප්‍රමාද කර තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු විසින් රු.1,583,054 ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස ඉල්ලා තිබුණි**.**

(ඇ) **පැකේජ ඊපී -04 යටතේ ඉදිකිරීම් වැඩ**

----------------------------------------

(i) **දමන - පන්නලගම - අම්බලන් ඔය මාර්ගය**

**--------------------------------------------**

ද්විත්ව තාර මතුපිට ඇතිරීම ( **Double Bituminous Surface Treatment )** සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

- **Ch 04+360** හා **Ch 04+375** ස්ථානයන්හි මතුපිට පිපිරීම් හා මීමී 10 චිප්ස් තැන්පත් නොකිරීම.
- සමහර ස්ථානයන්හි මතුපිට රළු ස්වභාවයන් පැවතීම**.**
- **Ch11+200** සහ **Ch 11+460** ස්ථානයන්හි දෙපැත්තේම වැලි ඇසිරීම ප්‍රමාණවත් නොවීම.
- Ch 21+640 **හා** Ch 21+790 **ස්ථානයන්හි රැළිවීම් සහ කුහර තිබීම.**

(ii) උපදේශකයේ අනුමැතිය ලබාගැනීමෙන් පසු කොන්ත්‍රාත්කරු විසින් 2013 ඔක්තෝබර් 16 දින වැඩ නිම වූ පසු තත්ත්වය පිළිබඳ සැලසුම් (As Built Drawings) කට්ටල දෙකක් ව්‍යාපෘතියට ඉදිරිපත් කළ යුතු වුවත්, කොන්ත්‍රාත්කරු විසින් එම සැලසුම් ඉදිරිපත් කර තිබුණේ 2014 අප්‍රේල් 29 දිනදීය.

**(iii)** ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට බිල්පත් ගෙවීම් දින **101** කින් ප්‍රමාද කර තිබුණි. එබැවින් කොන්ත්‍රාත්කරු විසින් රු. **1,764,435** ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස ඉල්ලා තිබුණි**.**

(ඈ) **පැකේජ ඊපී -07 යටතේ මාර්ග ඉදිකිරීම**

-------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රදේශය සමතලාවීම සහ මුහුදු මට්ටමේ සිට මධ්‍ය උස මීටර් 2-3 වූ බැවින් හා බිම් ජල මට්ටම ඉහළ හා කුඩා වර්ෂාවකට වුවද ජලය විශාල ලෙස ඉහළ යන බැවින් මාර්ගය තෝරා ගැනීම සඳහා විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජලයෙන් යටවීමේ හැකියාවක් හා එමගින් මාර්ගයට විශාල හානි සිදුවීමේ හැකියාවක් පැවතුණි.

(ii) මුල් වැඩ සැලැස්ම අනුව මෙම මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන් පස් වැඩ 2014 මාර්තු 25 දින ආරම්භ කළ යුතු විය. කෙසේ වුවද පස් වැඩ 2014 අප්‍රේල් 30 වන විටත් ආරම්භ කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**-------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම

(ආ) කොන්ත්‍රාත් පරිපාලනය